# මෑ

## *විග්නා අන්ග්විකුලාට - Vigna unguiculata*

## කුලය - ෆැබේසී

ශ්‍රී ලාංකිකයන් නිතර බෙහෙවින් ජනප්‍රිය එලවළු බෝගයක් ලෙස මෑ හැඳින්විය හැක. මෑ වගී ඉතා හොඳින් වගා කළ හැකි වන්නේ පහත රට තෙත්, අතරමැද හා වියළි කලාපීය ප්‍රදේශවලය.

### පස

වැලි ලෝම් පස් වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු යෝග්‍යතම පී.එච් . අගය 5.6 - 7 වේ. ජල වහනය දුර්වල ස්ථානවල සහ මැටි අධික පස්වල වගා නොකළ යුතුය.

### බිම් සැකසීම

සෙ.මී. 15-20 පමණ ගැඹුරකට පස පෙරළා කැට පොඩිකර ගන්න. තද වර්ෂා කාලයන්හි ජලය රැඳා සිටීමට ඉඩ ඇති ස්ථානවල උස් පාත්ති සකසන්න. ජල සම්පාදනය යටතේ වගා කරන අවස්ථාවේදී වැටි හා කානු සකසන්න. පාත්ති නොසාද සමතලා බිමෙහි වගා කරන්නේ නම්, විශේෂයෙන් මහ කන්නයේදී ඉඩමෙහි ජල වහන කානු සැකසීම වැදගත්ය.

### නිර්දේශිත ප්‍රභේද

හවරි මෑ - වැලක් ආකාරයට වර්ධනය වේ. ලා කොළ පැහැති දිගු කරල් වල අග කෙළවර දම් පැහැතිය. බීජ කළු පැහැතිය. දින 60 - 70 අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය.

පොළොන් මෑ - වැලක් ආකාරයට වර්ධනයවේ. තද දිග පැහැති කරල් වල දම් පැහැති පැල්ලම් ඇත. ක්‍රීම් පැහැති බීජවල බීජ ලපය ප්‍රදේශය කළුය. දින 60 - 70 දී අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය.

බුෂිටාවෝ(දේශිය)- පඳුරක් ආකාරයට වර්ධනයවේ. ලා කොළ පැහැති මධ්‍යම ප්‍රමාණයේ දිගකින් යුත් කරල් හටගනී. ක්‍රීම් පැහැති බීජවල බීජ ලපය ප්‍රදේශය දුඹුරු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙළීම ආරම්භ කළ හැකිය.

බී. එස් 1 - පඳුරක් ආකාරයට වර්ධනයවන මෙහි කරල් ලා කොළ පාටය. ක්‍රීම් පැහැති බීජවල දුඹුරු පැහැති පැල්ලම් ඇත. දින 45 - 50 දී අස්වැන්න නෙළීම ආරම්භ කළ හැකිය.

සේන - පඳුරු ආකාරයට වර්ධනයවන මෙම ප්‍රභේදයේ හටගන්නා මාංසල කරල් කොළ පැහැතිය. බීජ ක්‍රීම් පැහැති වන අතර බීජ ලපය රතු දුඹුරු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙළීම ආරම්භ කළ හැකිය.

පඳුරු පොළොන් මෑ -පඳුරු ආකාරයට වර්ධනය වන මෙම ප්‍රභේදයේ හටගන්නා කරල් මධ්‍යම ප්‍රමාණයේ දිගකින් යුක්තවේ. කොළ පැහැති කරල් මතුපිට දම් පැහැති පැල්ලැම් දක්නට ලැබේ. ආහාරයට සකසාගත් විට සාමාන්‍ය පොළොන් මෑ වල රසය ගෙනදෙයි. බීජ ක්‍රීම් පැහැති වන අතර බීජ ලපය කළු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙළීම ආරම්භ කළ හැකිය.

### බීජ අවශ්‍යතාවය

පඳුරු ආකාරයේ වගී - හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 17 - 20

වැල් ආකාරයේ වගී - හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 16 - 20

### වගා කාලය

වියළි කලාපයේ මහකන්නයේ දී නොවැම්බර් මස අවසාන භාගයේ දී වගාව ආරම්භ කරන්න. යල් කන්නයේ අහස් දියෙන් වගා කරන්නේ නම් මාර්තු හෝ අප්‍රේල් මාසවලදී බීජ සිටුවිය යුතුවන අතර ජල සම්පාදනය යටතේ නම් අප්‍රේල් හෝ මැයි මාසවලදී වගාව ආරම්භ කළ යුතුය.

තෙත් කලාපයේ මෙම බෝග වගා කළ යුත්තේ තද වර්ෂා කාලයට පසුවය.

## පරතරය

පඳුරු මෑ වගී - සෙ.මී. 60-75×සෙ.මී. 20

වැල් ආකාරයේ මෑ වගී - සෙ.මී. 90×සෙ.මී. 30 - ආධාරක

කෝටු වෙත වැල් වැඩීමට සලසන්න.

## පොහොර යෙදීම

බීජ සිටුවීමට පෙර දිරාපත් වූ කාබනික පොහොර යොදා පසට කළවම් කරන්න. එයට අමතරව පහත සඳහන් අන්දමට රසායනික පොහොරද වගාවට ලබා දෙන්න.

| | යූරියා හෙ./කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ./කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ./කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 45 | 135 | 65 |
| මාසයකට පසු | 45 | | |

## ජල සම්පාදනය

වගාවේ මුල් අවධියේ දී දින 4 පමණ වරක් බැගින් ද, ඉන්පසු සතියකට වරක් බැගින් ද ජලය සපයන්න. පසෙහි තෙතමනය වැඩිවීම නිසා පාමුල කුණුවීමේ රෝගය වැළඳීමට ඉඩ තිබේ.

## වල් පැළෑටි පාලනය

සති 2 සහ 4 දී වගාවේ වල් පැළෑටි ඉවත් කරන්න.

## කෘමි පාලනය

කිහිප වර්ගයකට අයත් කරල් විදින දළඹුවන්, පත්‍ර කීඩෑවන්, කුඩිත්තන් සහ පිටි මකුණන් නිසා මෑ වගී වලට හානි සිදුවිය හැකිය. දරුණු මට්ටමේ හානියක් පවතින අවස්ථාවලදී පමණක් නිර්දේශිත කෘමිනාශක යොදා එකී කෘමීන් පාලනය කිරීමට කටයුතු කරන්න. කෘමිනාශක යෙදීමට පෙර සුදුසු අවස්ථාවට පත්වී ඇති කරල් නෙලා ගැනීමට කටයුතු කරන්න. කෘමි නාශක ලේබලයේ සඳහන් පෙර අස්වනු කාලය ගත වීමට පෙර, නැවත අස්වැන්න නෙලීම පාරිභෝගික සෞඛ්‍යයට අහිතකරය.

## රෝග පාලනය

### පාමුල කුණුවීම

පත්‍ර කහ පාට වන අතර රෝගී පැල මැලවී යයි. කඳ පාමුල ප්‍රදේශයෙන් දුඹුරු පැහැති දුර්වර්ණවීමක් ඇති වී එය ක්‍රමයෙන් ඉහළ ප්‍රදේශය දක්වා වර්ධනයවේ.

බෝග මාරුව, පසෙහි අධික තෙතමන තත්වයක් ඇති නොවීමට වග බලා ගැනීම හා වැඩිපුර නයිට්‍රජන් අඩංගු රසායනික පොහොර නොයෙදීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යෙදීමෙන් රෝගය පාලනය කර ගත හැකිය. රෝගය දරුණු තත්වයට පත්වී ඇත්නම් නිර්දේශිත දිලීර නාශකයකින් පස තෙත් කළ යුතුය.

### අළු පැහැති කඳ අංගමාරය

මෙය තෙත් කලාපයේ වගාවන් සඳහා බහුල වශයෙන් වැළඳිය හැකි රෝගයකි. රෝගය ඇතිවන්නේ මැක්‍රොෆෝමිනා ෆේසියෝලි නැමැති දිලීරය නිසාය.

මෙම රෝගය කුඩා පැල වලට මෙන්ම තරමක් වැඩුන පැල වලටද වැළඳිය හැකිය. මූලික රෝග ලක්ෂණ වශයෙන් අළු දුඹුරු පැහැති ගිල්වුන ස්වභාවයක් ගන්නා වියළි පැල්ලම් කඳෙහි පාදස්ථ ප්‍රදේශයෙහි ඇති වේ. ශාකය ක්‍රමයෙන් වැඩෙත්ම, මෙම රෝග පැල්ලම් පැළෑටියේ අග්‍රස්ථ ප්‍රදේශය දක්වා ක්‍රමයෙන් විශාල වේ. එවිට ක්‍රම ක්‍රමයෙන් පැළෑටිය මැල වී පසුව මැරී යයි. රෝගී ගස්වල පත්‍ර කහපාට වී මැරීයාමද සිදුවේ. රෝගය දරුණු මට්ටමින් පවතින වගාවන්හි විශාල අස්වනු හානියක් ඇතිවිය හැකිය.

පඳුරු පොළොන් මෑ ප්‍රභේදය මෙම රෝගයට හොඳින් ඔරොත්තු දෙන අතර බී.එස්. 1 ප්‍රභේදය එයට විශාල වශයෙන් ගොදුරු වේ. සේන සහ බුෂිටාවෝ දේශීය ප්‍රභේද මෙම රෝගයට මධ්‍යස්ථ මට්ටමකින් ඔරොත්තු දේ.

වගාවට සති 4 පමණ වයස් වූ විට ටෙබුකොනසෝල් (ෆොලිකර්) දිලීර නාශකය යෙදීමෙන් සාර්ථකව රෝගය පාලනය කරගත හැකිය.

## අස්වැන්න නෙලීම

පඳුරු ආකාරයේ වගීවල සෑම දින 3 - 4 වරක් බැගින් අස්වනු වාර 7 - 12 පමණ ලබාගත හැකිය. වැල් ආකාරයේ වගී වලින්ද සෑම දින 3- 4 වරක් බැගින් අස්වනු වාර 15 - 16 පමණ ලබාගත හැකිය.

## අස්වැන්න

පොළොන් සහ හවරි මෑ - හෙක් 1/මෙ.ටොන් 12

බුෂිටාවෝ දේශීය, බී. එස්. 1 හා සේන - හෙක් 1/මෙ.ටොන් 10

පඳුරු පොළොන් මෑ - හෙක් 1/මෙ.ටොන් 9